8764

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation
- 2019

ශ්‍රේණිය / தரம் / Grade	8	
විෂයය / பாடம் / Subject	ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා	
පත්‍රය / வினாத்தாள் / Paper	I ,II	
කාලය / காலம் / Time	පැය 02යි.	

නම:.. විභාග අංකය:..

සැලකිය යුතුයි.
- ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 50ක් හිමිවන අතර, ඉතිරි ලකුණු 50 වර්ෂය තුළ දී සිදු කරන ලද පාසල් පාදක ඇගයීම් මත ලබා දෙනු ඇත. සම්පූර්ණ ලකුණු ප්‍රමාණය 100 කි.
- ප්‍රශ්න පත්‍රය I කොටස II කොටස්වලින් සමන්විතය. පළමු කොටසේ සියලු ම ප්‍රශ්නවලටත්, දෙවන කොටසින් ප්‍රශ්න හතරකට ද පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

(අ) නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ගෙවත්තක් පහසුවෙන් පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය කරන ප්‍රධාන සාධක වන්නේ,
    1. භූමියේ ඉඩකඩ, ජල විදුලිය, වාතය හා ශ්‍රමය ය.
    2. භූමියේ ප්‍රමාණය, යන්ත්‍ර සූත්‍ර, ශ්‍රමය හා මුදල් ය.
    3. භූමියේ ඉඩකඩ, ජල පහසුව, ශ්‍රමය හා ආරක්ෂාව ය.
    4. භූමියේ ප්‍රමාණය, යන්ත්‍ර සූත්‍ර, ජලය හා වාතය ය.

02. ජලය රඳා පවතින ජලාශයකි,
    1. ගංගා 2. වැව් 3. උල්පත් 4. ඇළදොළ

03. නිෂ්පාදන පිරිවැයෙහි මූලිකාංගයක්/ මූලිකාංග වන්නේ,
    1. ද්‍රව්‍ය පිරිවැය ය. 2. ශ්‍රම පිරිවැය ය.
    3. පොදු කාර්ය පිරිවැය ය. 4. මේ සියල්ලම ය.

04. ලෝහ ද්‍රව්‍ය නිමහම් කිරීම සඳහා භාවිත කරන පසු නිමහම් ද්‍රව්‍ය වන්නේ,
    1. එනමල් තීන්ත හා විසුරුම් තීන්ත ය. 2. වාර්නිෂ් හා ලැකර් ය.
    3. ප්‍රංශ පොලිෂ් හා ඉටි වර්ග ය. 4. එනමල් තීන්ත හා ලැකර් ය.

05. මාළු ඇඹුල් තියල් සකස් කිරීමේ දී යොදා ගන්නා ද්‍රව්‍ය වන්නේ,
    1. බැදපු මිරිස් කුඩු, ගොරකා හා ලුණු ය. 2. ගම්මිරිස්, ලුණු හා වියළි මිරිස් කුඩු ය.
    3. ගම්මිරිස්, ගොරකා හා තුනපහ ය. 4. ගොරකා, ගම්මිරිස් හා ලුණු ය.

06. සත්ත්ව පාලනයේ දී භාවිත වන ක්‍රමයක් ලෙස නිදැලි ක්‍රමය හැඳින්විය හැකි ය. නිදැලි ක්‍රමයේ අවාසියක් වන්නේ,
    1. සතුන් සඳහා නිවාස සැපයීමට අවශ්‍ය නොවීම ය.
    2. සතුන් සඳහා ආහාර සැපයීමට අවශ්‍ය නොවීම ය.
    3. වගාකර ඇති බෝගවලට සතුන්ගෙන් හානි සිදු වීම ය.
    4. සතුන් රැකබලා ගැනීමට ශ්‍රම අවශ්‍යතාව අඩු වීම ය.

07. සෙකටියරයක් භාවිතයෙන් නෙළීම සිදුකරන්නේ මින් කුමන පලතුරක් ද?
    1. තක්කාලි 2. මිදි 3. අඹ 4. පැපොල්

08. පාපැදියක බලය සම්ප්‍රේෂණය වන පිළිවෙල වන්නේ,
1. පාදිකය, පාදික ලීවරය, ඉදිරිපස දැති රෝදය හා දම්වැල ඔස්සේ ය.
2. පාදිකය, ලීවරය, ඉදිරිපස දැති රෝදය හා දම්වැල ඔස්සේ ය.
3. පාදිකය, දම්වැල, පාදික ලීවරය හා ඉදිරිපස දැති රෝදය ඔස්සේ ය.
4. දම්වැල, පාදිකය, ඉදිරිපස දැති රෝදය හා ලීවරය ඔස්සේ ය.

09. නිශ්චිත කාල රාමුවක් සහිත ප්‍රායෝගික ක්‍රියාකාරකම් රැසකින් සමන්විත වූ යම් ඉලක්කයක් කරා ගමන් කරන ක්‍රියාවලිය මෙ නමින් හැඳින්වේ.
1. ස්වනිර්මාණ ගොනුව. 2. කාල රාමුව.
3. ව්‍යාපෘතිය. 4. පසු විපරම.

10. උතුරු දකුණු දිශා ඔස්සේ බෝග වගා කිරීමේ දී,
1. පාංශු ඛාදනය වළක්වා ගත හැකි ය. 2. බෝගවලට ඉඩකඩ ප්‍රමාණවත්ව ලැබේ.
3. පස ආවරණය වන බෝග සිටුවීමට පහසු වේ. 4. භූමියට හොඳින් හිරුඑළිය ලැබේ.

11. ආහාර නරක් වීම කෙරෙහි බලපාන භෞතික සාධක වන්නේ,
1. ආහාරවල බැක්ටීරියා හා දිලීර ක්‍රියා කිරීම ය.
2. ආහාර තැලීම හා සීරීම ය.
3. ආහාරවලට කෘමි රසායන හා තෙල් එකතු වීම ය.
4. ආහාරවල ගුල්ලන් හා මීයන් බෝවීම ය.

12. ඔබ පාසලේ දී සකස් කළ සරල ඉලෙක්ට්‍රොනික පරිපථයක ධාරාව ගමන් කිරීම පාලනයට හෝ ඊට බාධකයක් ලෙස සවිකරන උපාංගයකි,
1. ධාරිත්‍රකය. 2. ට්‍රාන්සිස්ටරය. 3. ප්‍රතිරෝධකය. 4. LED බල්බය.

13. වගා බිමට වසුන් යෙදීමෙන් සිදුවන්නේ,
1. පරිසර අලංකරණය ඇති කිරීම ය. 2. වගා බිම පිරිසිදු කිරීම ය.
3. කෘමි ආකර්ෂණය ඇති කිරීම ය. 4. පසේ තෙත් බව ආරක්ෂා කිරීම ය.

14. යෝගට් සෑදීමේ දී 42^0C උෂ්ණත්වයක් ලබා දී, එම උෂ්ණත්වය යටතේ යෝගට් නිශ්චලව තැබිය යුතු කාලය කොපමණ ද?
1. පැය 4 - 5 2. පැය 4 - 6 3. පැය 5 - 6 4. පැය 5 - 7

15. පාසලේ ඇති ඔබට විසඳිය හැකි ගැටලුවක් සඳහා ව්‍යාපෘතියක් සැකසීමට ඔබව යොමු කර ඇත. ඒ සඳහා ඔබ ගන්නා පළමු පියවර කුමක් ද?
1. සැලසුම් කිරීම. 2. තීරණ ගැනීම. 3. පසු විපරම. 4. ක්‍රියාත්මක කිරීම.

16. වෙළඳපොළ හිදැසක් යනු,
1. ව්‍යාපාරයේ සිදුරක් ඇති වීම යි. 2. ව්‍යාපාරය අත්හැර දැමීම යි.
3. වෙළඳපොළ අවස්ථාවක් ඇති වීම යි. 4. වෙළඳපොළ පරීක්ෂණය යි.

17. වර්ෂාපතනය අඩු ප්‍රදේශවල ගෙවතු වගා කටයුතුවල දී කළ හැකි සරල ක්‍රමයකි,
1. වර්ෂා කාලයට පමණක් වගා කිරීම. 2. විශාල ශාක පමණක් සිටුවීම.
3. පිට ප්‍රදේශවලින් ජලය රැගෙන ඒම. 4. ජල හිඟයට ඔරොත්තු දෙන බෝග වගා කිරීම.

18. ශීතකරණයේ දොර වැසී මුද්‍රා තැබීම සඳහා භාවිත කර ඇති උපක්‍රමය වන්නේ,
1. ප්ලාස්ටික් පටියක් යෙදීම ය. 2. කාන්දම් බලයක් සහිත පටියක් යෙදීම ය.
3. රබර් පටියක් යෙදීම ය. 4. වානේ පටියක් යෙදීම ය.

19. නෙළා ගනු ලබන කිරි සහිත පලතුරුවල එම කිරි ඉවත් කිරීමට ගත හැකි නිවැරදි ම ක්‍රමය වන්නේ,
1. පිරිසිදු මඳ උණුසුම් ජලයෙන් සේදීම ය. 2. නෙළාගත් අස්වැන්න ශ්‍රේණිගත කිරීම ය.
3. රෙදි කඩකින් පිසදා තැබීම ය. 4. පිරිසිදු ඇල් ජලයෙන් සේදීම ය.

20. ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ දී ව්‍යාපාර සතු සමාජ වගකීම් ඉටු කළ හැකි කරුණ / කරුණු වන්නේ,
1. ප්‍රජා සංවර්ධනය ය.
2. පරිසර හිතකාමී ව්‍යාපාර ය.
3. පාරිභෝගික යහපත කෙරෙහි සැලකිලිමත් වීම ය.
4. මේ සියල්ල ම ය.

(ලකුණු 01 × 20 = 20)

II කොටස

සැලකිය යුතුයි.

● ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) බෝග වගාවට හානි කරන කෘමි සතුන් ඉවත් කිරීමට භාවිත කරන ඇටවුමක් නම් කරන්න.
(ii) ආක්‍රමණශීලී වල් පැළෑටි දෙකක් නම් කරන්න.
(iii) ගොවිපොළ අපද්‍රව්‍ය නිසා පරිසරයට ඇති විය හැකි අහිතකර බලපෑම් තුනක් ලියන්න.
(iv) බෑවුම් සහිත භූමිවල සිදුවන පාංශු ඛාදනය වැළැක්වීම සඳහා ගත හැකි පියවර තුනක් ලියන්න.

(මුළු ලකුණු 7 1/2)

02. (i) පසු අස්වනු හානිය පිළිබඳ ව්‍යාපෘතියක් සැලසුම් කිරීමේ දී පහත කරුණු කෙරෙහි අවධානය යොමු විය. ඒවා නිවැරදි පිළිවෙළින් පෙළගැස්වීම සඳහා දී ඇති හිස් කොටුවේ අංකය යොදන්න.

A. පිරිසිදු කිරීම. ☐

B. ශ්‍රේණිගත කිරීම. ☐

C. අස්වනු නෙළීම. ☐

D. ප්‍රවාහනය. ☐

E. ඇසිරීම හා ගබඩා කිරීම. ☐

F. පරිභෝජනය. ☐

G. බෙදාහැරීම. ☐

(ii) නරක් වූ ආහාරයක ලක්ෂණ හතරක් ලියන්න.
(iii) ආහාර සකස් කරන පුද්ගලයා විසින් පැළඳිය යුතු දේවල් හතරක් නම් කරන්න.

(මුළු ලකුණු 7 1/2)

03. (i) ඉලෙක්ට්‍රොනික පරිපථ එකලස් කිරීමේ දී පෑස්සීම සඳහා යොදන ද්‍රව්‍ය නම් කරන්න.
(ii) පරිපථ එකලස් කිරීමේ දී අවශ්‍ය වන උපකරණ හතරක් ලියන්න.
(iii) අවකාශ කළමනාකරණයේ දී, සීමිත ඉඩකඩ වැඩි ඵලදායිතාවයක් සහිතව භාවිත කිරීම සඳහා, නිර්මාණ කිරීමේ දී යොදා ගත හැකි උපක්‍රම දෙකක් ලියන්න.
(iv) එදිනෙදා භාවිත කරන උපකරණ හා යන්ත්‍ර, භාවිතයෙන් ඉවත් කිරීමට සිදුවන අවස්ථා තුනක් ලියන්න.

(මුළු ලකුණු 7 1/2)

04. (i) ප්‍රචාරණයේ මූලිකාංග තුන ලියන්න.
(ii) ඉලක්ක වෙළෙඳපොළක් ඛණ්ඩනය කළ යුතු ආකාරය නිගමනය කිරීමේ දී නිෂ්පාදකයකු විසින් අවධානය යොමු කළ යුතු සාධක හතරක් ලියන්න.
(iii) නිෂ්පාදනයේ දී තමා දැරූ පිරිවැය දැනගැනීමෙන් අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න.
(iv) ඍජු හා වක්‍ර පිරිවැයට අදාළ අයිතම දෙක බැගින් ලියන්න. (මුළු ලකුණු 7 1/2)

05. (i) ජීවානුහරණ යන්ත්‍රයක් ලෙස භාවිත කරන උපකරණයක් නම් කරන්න.

(ii) අධි ශීතකරණ කුටීරයේ ගබඩා කළ යුතු ආහාර වර්ග දෙකක් සඳහන් කරන්න.

(iii) (අ) වියළීමෙන් ආහාර කල්තබා ගැනීම සඳහා භාවිත කරන උපකරණය නම් කරන්න.

(ආ) වියළීමෙන් කල්තබා ගන්නා ආහාර වර්ග හතරක් ලියන්න.

(iv) නිවසේ දී පරිභෝජනය සඳහා කේක් ගෙඩියක් මිල දී ගැනීමේ දී ඔබ සැළකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න.

(මුළු ලකුණු 7 1/2)

06. (i) වගා කුළුණක් සකස් කිරීමේ දී යොදා ගන්නා වගා මාධ්‍ය සඳහන් කර ඒවා සකස් කළ යුතු අනුපාතය ලියා දක්වන්න.

(ii) ඔබගේ නිවස සහිත භූමියේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීමේ ගැටලුවට ඔබ ගන්නා විකල්ප විසඳුම් දෙකක් යෝජනා කරන්න.

(iii) හස්ත හා විසිතුරු කර්මාන්ත සඳහා යොදා ගත හැකි ශාක වර්ග දෙකක් ලියන්න.

(iv) සැලසුම් සහගත ගෙවත්තක් නිර්මාණය කිරීමේ දී පහත බෝග වර්ග වගා කිරීමට තීරණය විය. ඒවායේ රෝපණ ද්‍රව්‍ය ඉදිරියෙන් ලියන්න.

- වැරණිය මිරිස් -
- කහ -
- ඉඟුරු -
- ගම්මිරිස් -
- රම්පේ -
- කංකුං -
- මුකුණුවැන්න -
- ගොටුකොළ -
- තම්පලා -
- සලාද -

(මුළු ලකුණු 7 1/2)